**මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාව**
**-----------------------------------**

**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------**

2015 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 සැප්තැම්බර් 01 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මන්මුනේ නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**-------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවට අයිති වාහන දහ තුනක් සහ යන්ත්‍රෝපකරණ එකොළහක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) බැංකුවට සෘජු ප්‍රේෂණ ලෙස ලැබී තිබූ සමාලෝචිත වර්ෂය සඳහා වූ ස්ථාවර තැන්පතු පොලී සහ උසාවි දඩ පිළිවෙලින් රු.84,500 ක් හා රු.206,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී මෝටර් ග්‍රේඩර් සහ JCB යන්ත්‍ර කුලියට දී ලබා ගත් ආදායම වූ රු.40,000 ක මුදල ආදායමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට තැන්පත් ගිණුමෙහි සඳහන් කර තිබුණි.

**1.3.2 නොසැසඳූ පාලන ගිණුම්**
**--------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව සේවක ණය ගිණුමේ ශේෂය රු.2,802,793 ක් වන නමුත්, සේවක ණය ලේඛනය අනුව ශේෂය රු.2,959,300 ක් වූයෙන් රු.156,507 ක වෙනසක් පෙන්නුම් කෙරුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ලෙජරය අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.1,461,405 ක් වූ නමුත් කේවල අත්තිකාරම් ශේෂවල එකතුව රු.26,058 ක් වූයෙන් රු.1,435,347 ක වෙනසක් පෙන්නුම් කෙරුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියේ පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබිණි.

| | විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | ඉඩම් හා ගොඩනැගිලි | 840,349,208 | ඉඩම් හිමිකම් ඔප්පු |
| (ii) | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,256,663 | ස්ථාවර වත්කම් ලේඛන |
| (iii) | මෝටර් රථ වාහන සහ කරත්ත | 11,750,000 | ස්ථාවර වත්කම් ලේඛන |
| (iv) | ලී බඩු හා උපකරණ | 5,143,072 | ස්ථාවර වත්කම් ලේඛන |
| (v) | ගබඩාවේ තොග | 102,009 | ගබඩා ලෙජරය |

**1.3.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම**

විගණනයේ දී පහත දැක්වෙන නීති රීති සහ අණපනත්වලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන ) රීති** | |
| (i) 1 වන පරිච්ඡේදයේ 5(12) රීති | මූල්‍ය සහ ගබඩා භාණ්ඩ යනාදිය රාජකාරි මට්ටමෙන් තිදෙනෙකුට පවරා ඇතත් එම අයගෙන් ඇප මුදල් ලබා ගෙන නොතිබුණි. |
| (ii) X පරිච්ඡේදයේ 193 රීති | වර්ෂය සඳහා වූ තථ්‍ය ආදායම සහ වියදම් පිළිබඳ විස්තර ගිණුම් අයවැය ලේඛනය සමඟ සසඳා බලා වෙනසට අදාල කරුණු ඇතුළත් ප්‍රකාශයක් සකස් කොට විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබිණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.5, 685, 067 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු. 8, 426,849 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,741,782ක පසුබැස්මක් පෙන්නුම් කෙරිණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

සේවයෙන් අස් වූ සහ මිය ගිය නිලධාරීන් දෙදෙනකුගෙන් අය කර ගත යුතු සේවක ණය හිග මුදල් රු.189, 947 ක් අවුරුදු හතරක් තිස්සේ හිග මුදල් වශයෙන් පැවතියද එය ඔවුන් ගේ ඇපකරුවන්ගෙන් හෝ විශ්‍රාම පාරිතෝෂික මුදල්වලින් අය කර ගැනීමට 2016 අප්‍රේල් 29 දක්වා කටයුතු කර නොතිබුණි.

**3.2** **මානව සම්පත් කළමනාකරණය**

සභාවට අයත් පාවිච්චි කරනු ලබන වාහන 14 ක් සඳහා රියදුරන් තුන් දෙනෙක් පමණක් සේවයේ යොදවා තිබුණි.

**4.** **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් කළමනාකරණය